# 14. සුවඳ හමන මල් වෙමු අපි

අම්මා : දහම් පාසලේ තෑගි බෙදා දීමේ උත්සවය හරි හොඳයි නේ ද?

තාත්තා : ඔව්, මටත් හරි ම සතුටුයි.

අම්මා : ළමයින් හරි සතුටෙන් හිටියෙ.

තාත්තා : අපේ ළමයි දෙන්නා දහම් පාසල් යන්න පටන් ගත් දා සිට හුඟාක් වෙනස් වෙලා වාගේ නේ ද?

අම්මා : පියතුමා, සිස්ටර්ලා, බ්‍රදර්ලා සහ දහම් පාසලේ උගන්වන ගුරුවරු බොහෝ මහන්සි වෙනවා.

තාත්තා : දන්නවා ද? සමන්මලී දුව ඊයේ හොඳ කතාවක් කිව්වා නේ.

අම්මා : ඒ මොකක් ද?

තාත්තා : "අම්මාට, තාත්තාට ආදරය කරනවා කියන්නේ දෙවි පියාට ආදරේ කිරීමයි" කියලා කිව්වා.

අම්මා : ඔය දහම් පාසලේ සිස්ටර්ලා කියා දීපු දේ වෙන්න ඕනෑ. සිස්ටර්ලාට බ්‍රදර්ලාට සහ දහම් ගුරුවර ගුරුවරියන්ට එයාලා හරි ම ආදරෙයි.

තාත්තා : කෝ, මේ දෙන්නා දැන්.



අම්මා : ආ අර, දෙන්නා ම එකතු වෙලා මල් පැළවලට වතුර දානවා.

තාත්තා : දැන් පාසලේ වැඩවලටත් දෙන්නා හරි ම උනන්දුයි නේ ද?

අම්මා : ඒ විතරක් නොවේ. දෙන්නා ම උදේ නැගිටපු ගමන් යාච්ඤා කරනවා. ඉන්පසු ඇඳ ඇතිරිලි සකස් කරලා පිළියෙල කරනවා.
දැන් පුතා එයාගේ සපත්තු මේස් වුනත් හැම තැන ම දාන්නෙත් නෑ. දෙන්නා ම එකතු වෙලා කෑම මේසයත් අස් කරලා අතු ගානවා.

තාත්තා : අපට මේ දරුවන් වාගේ ම, ඔවුනට යහ මඟ පෙන්වන දහම් ගුරුවර ගුරුවරියන් දුන්නා වූ දෙවි පියාට ස්තුති වේවා!

අම්මා : සියලු ම ළමයි දහම් පාසල් යනවා නම් කොපමණ අගෙයි ද?

## පැවරුම්

1. යහපත් ළමයින් වශයෙන් දෙවි පියා සතුටු කිරීමට ඔබට කළ හැකි කාර්යයන් පහක් අභ්‍යාස පොතේ ලියන්න.
2. දහම් පාසල් යාමට උනන්දු වන්න.